# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2016/47 – 2017 අප්‍රේල් 28 වැනි සිකුරාදා – 2017.04.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහගල්බොඩ මෙගොඩ කෝරළේ (දකුණ) සුළු කොට්ඨාසයේ අංක 725 නාරම්පොල ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ, ඉඩංගාපොල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේයූ/එම්එල්එල්/2015/259-ඒ සහ 2015.11.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ 'ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0379ක් පමණ වන කෝන්ගහමුලවත්ත නැමැති ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – **කෝන්ගහමුලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0379ක් පමණ**

උතුරට: මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය සහ දදුරුඔය; නැගෙනහිරට: දදුරුඔය සහ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ඉඩම; දකුණට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ඉඩම සහ ක්‍රිස්තෝගු බදුගේ කරුණාරත්න හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: ක්‍රිස්තෝගු බදුගේ කරුණාරත්න හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2015/ඩබ්ලිව්එස්/28.
2017 පෙබරවාරි මස 13 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 - 411